# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2189/56 - 2020 අගෝස්තු මස 22 වැනි සෙනසුරාදා - 2020.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ආ (2) වගන්තිය යටතේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 ආ (2) වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන සෙල්ලෙයා ප්‍රේමකාන්ත් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අරුලානන්දම් තවකුමාරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, කාන්දිරාසා කාන්දීපන් වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය වූ) 66 ආ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අරුලානන්දම් තවකුමාරන් යන අය පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**කේ. කාන්දීපන්,**  
තේරීම්භාර නිලධාරි,  
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

2020 අගෝස්තු මස 21 වැනි දින,  
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,  
මුලතිව්.

1A - G 32649 — 31 (2020/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*